# මුදල් ප්‍රතිපත්ති විවරණය සැකෙවින්


## 2026 මැයි

## මහ බැංකුවේ අලුත් ම තීරණය කුමක් ද?

එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 8.75% දක්වා පදනම් **අංක 100කින් ඉහළ දැමීමට** මහ බැංකුව තීරණය කළා

**8.75%**

## එම තීරණයට බලපෑ හේතු?




- උද්ධමනය, යම් කාලයක් සඳහා ඉලක්කගත මට්ටමට වඩා ඉහළින් පවතිනු ඇතැයි අපේක්ෂා කිරීම
- බලශක්ති මිල ගණන් ඉහළ යෑම මගින් උද්ධමන පීඩන තවදුරටත් තීව්‍ර වීමේ හැකියාවක් පැවතීම
- අබණ්ඩ ණය ප්‍රසාරණය හේතුවෙන් ආනයන ඉල්ලුම ඉහළ යෑම
- විදේශීය අංශය මත පීඩන දක්නට ලැබීම
- උද්ධමන අපේක්ෂා, උද්ධමන ඉලක්කයෙන් බැහැර වීමේ අවදානමක් පැවතීම

## අනාගතයේ දී ආර්ථිකයට කුමක් සිදු විය හැකි ද?




- උද්ධමනය කෙටි කාලීනව 5% ඉලක්කගත මට්ටමට වඩා ඉහළ මට්ටමක පවතිනු ඇති අතර, ඉන් අනතුරුව මැදි කාලීනව යම් තරමක් ලිහිල් වී ඉලක්කය වටා ස්ථායී වනු ඇතැයි බලාපොරොත්තු වේ
- බහුපාර්ශ්වීය ලැබීම්, භූ දේශපාලනික ආතතීන්ගේ අපේක්ෂිත අඩු වීම සහ ශ්‍රී ලංකා රජය හා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෑත කාලීනව ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් විදේශීය අංශයේ තත්ත්වය වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ

*දේශීය සහ ගෝලීය ආර්ථික ප්‍රවණතා සමීප ව නිරීක්ෂණය කරමින් සහ ආර්ථික වර්ධනයට සහාය වෙමින් මැදි කාලීනව උද්ධමනය 5%ක ඉලක්කගත මට්ටමේ පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මහ බැංකුව සූදානමින් සිටිනවා*


ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA